**මනෝ විද්‍යාව**



# ලිංගික ගැටලු හා මෙරට සමාජය

මනෝවෛද්‍ය විශේෂඥ
වෛද්‍ය සරත් පඬුවාවල

ලිංගික ප්‍රශ්න හා ඊට සම්බන්ධ මානසික හා සමාජයීය ගැටලු මෙරට සුලබ ය. අප සංස්කෘතිය හා බැඳි නොයෙකුත් විස්වාස හා වත්පිළිවෙත් ආදිය ද මීට බලපා ඇත. මෙම ප්‍රශ්නවලින් පීඩා විඳින්නන් අතර ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අය සිටින අතර බොහෝ දෙනෙක් මේ පිළිබඳව රහස්‍යභාවය රැක ගැනීමට උත්සුක වෙති. මේ නිසා මොව්හු, ලිංගික ගැටලු බරපතල ආබාධ ලෙස හුවා දක්වා ඒවාට ඖෂධ ප්‍රතිකාර කිරීමට පුවත්පත්වල දැන්වීම් පළකරන වෛද්‍යවරුන් යයි කියා ගන්නා පිරිසකට ලෙහෙසියෙන් ගොදුරුවෙති. ප්‍රතිඵලය වන්නේ මොවුන් හමුවී තම කාලය ශ්‍රමය හා ධනය නිකරුනේ වැයකිරීමයි.

තුරුණුවියේ සිට මහලුවිය දක්වා ඇතිවන බොහෝ ලිංගික ගැටලුවලට ප්‍රධාන හේතුව වන්නේ ඒ පිළිබඳ හරි අවබෝධයක් නොමැතිවීම යි. තුරුණුවියේ සිටින්නන්ට තම ලිංගික අවයව හා උපාංගයන් ගැන නිවැරදි දැනීමක් නොමැතිවීම සුලභ මානසික ගැටළු ඇතිකරවයි. සමහර තරුණයන්ට තම ශිශ්නයේ ප්‍රමාණය මදිබව සිතේ. එය හරි කෙලින් නොපිහිටා ඇදවී හෝ වකුටුවී ඇති බව හැඟේ. තවද එහි පෙරසම යට ගැටිති හෝ සුදුපැහැති ද්‍රව්‍යයක් තැන්පත්වී ඇති බව ශිශ්නයේ මුල කුරුලෑ වැනි ගැටිති ඇති බව, කෝෂ දෙපස ඒකාකාරව නොපිහිටා පැත්තක් පහත්වී ඇති බව ආදිය තවත් ගැටලු ය. මේ පිළිබඳව ඔවුන් නිතර කල්පනා කරමින් බියෙන් කල්ගෙවන අතර කිසිවකුගෙන් හරි උපදෙසක් නොලැබේ. මේවාට අමතරව සිහින පෙතී හෝ නොපෙතී ශුක්‍ර පහවීම හෝ ස්වයං වින්දනය මගින් ශුක්‍ර පහවීම ආදී කරුණු පිළිබඳ වූ ගැටලු ද ඉතා සුලභ ය.

සාමාන්‍යයෙන් ප්‍රාණවත් පුරුෂ ශිශ්නයේ දිග අඟල් 4-6 පමණ විමට පුළුවන. සමහරුන් ගේ අඟල් 3 සිට සමහරුන් ගේ අඟල් 7-8 දක්වා දිගුවීමට පුළුවන. ස්ත්‍රී යෝනි මාර්ගය සාමාන්‍යයෙන් අඟල් 3 1/2 ක් පමණ වේ. එය ඇදෙන සුළු බැවින් ඕනෑම ප්‍රමාණයක ශිශ්නයක් එහි තැන්පත් කිරීමට හැකි අයුරින් එය පිහිටා ඇත. එම නිසා ශිශ්නයේ දිග පළල කුමක් වුවද ප්‍රශ්නයක් නොවේ. නමුත් එය ඉතා දිග වන විට (අඟල් 10 පමණ) සමහර අවස්ථාවල දී ස්ත්‍රියට යම් ප්‍රශ්න ගෙනදිය හැකි ය. තවද ශිශ්නය ඇදවී පිහිටියත් එය එහි ක්‍රියාකාරිත්වයට බාධාවක් නොවේ. ශිශ්නයේ පෙරසම යට ගැටිති වැනි ස්වභාවයක් තිබීම සාමාන්‍ය දෙයකි. පෙරසම යට ඇති පුංචි ග්‍රන්ථවලින් නිපදවන සුදුපැහැ ද්‍රව්‍යය එම පෙදෙස නොසෝදා තිබෙන විට එකතු වී එහි කසන සුළු ස්වභාවයක් ඇතිවීමට පුළුවන. කෝෂයේ අඩංගු වන්නේ වෘෂණ යුගලයයි. ඉන් ශුක්‍රාණු නිපදවන අතර එම ක්‍රියාවලියට අවයවය නියත උෂ්ණත්වයක පැවතිය යුතු ය. මෙම කාර්ය සාර්ථකවීම සඳහා කෝෂ සීතල වේලාවට හැකිලීමත්, උෂ්ණාධික වේලාවට දිග හැරීමත් සිදු වේ. තවද එහි එක් පැත්තක් පහළට ඇදී තිබීම අසාමාන්‍ය දෙයක් නොවේ.

තරුණ ගැහැනු ළමුන් මානසිකව පීඩාවට පත්කරවන කරුණු (ලිංගික) අතර, සුදයාම හා ඉන් යට ඇඳුම් තෙත්වීම, ආර්තව චක්‍රයේ අක්‍රමවත්බව හා ඊට සම්බන්ධ වේදනාවන් ද වේ. ස්ත්‍රී ලිංගික පද්ධතිය ආවරණය වී පිහිටා ඇති බැවින් බොහෝ දෙනකුට එහි උපාංග පිළිබඳ අවබෝධයක් නැත. යෝනි මාර්ගයෙන් ශ්‍රාවයන් පිටවීම සාමාන්‍ය දෙයකි.

ලිංගික උත්තේජනය අනුව ගලන ශ්‍රාවය අඩු වැඩි විය හැක. සමහරුන් මෙය ඇඟ උණුකරවා යාම යනුවෙන් හඳුන්වන බැවින් (විශේෂයෙන් පුවත්පත්වල පළවන දැන්වීම්වල) මෙයට බියවෙති. ගැහැනු ළමයකු වැඩිවියට පත්වී කලක් ගතවනතුරු ආර්තව චක්‍රය මසකට වරක් ඇතිනොවී අක්‍රමවත්ව පැවතිය හැකි ය. ආර්තවය මසකට වරක් තිබිය යුතුය යන්නත් එය නිසිකලට ක්‍රමවත් කිරීමට ඇති බෙහෙත් පිළිබඳ දැන්වීම් පළකරන "වෛද්‍යවරුන්" නිසාත් මේ පිළිබඳව කාන්තාවන් අතර බියක් පවතී. කන්‍යාභාවය පිළිබඳ ගැටලු කාන්තාවන් අතර සුලබ ය. විශේෂයෙන් නොයෙකුත් ක්‍රීඩාවලට සහභාගිවුවත්, ස්වයං වින්දනයෙහි යෙදුනවුන්, පිරිමි සමග බාහිර

මෙම ප්‍රශ්නවලින් පීඩා විඳින්නන් අතර ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අය සිටින අතර බොහෝ දෙනෙක් මේ පිළිබඳව රහස්‍යභාවය රැක ගැනීමට උත්සුක වෙති. මේ නිසා මොව්හු, ලිංගික ගැටලු බරපතල ආබාධ ලෙස හුවා දක්වා ඒවාට ඖෂධ ප්‍රතිකාර කිරීමට පුවත්පත්වල දැන්වීම් පළකරන වෛද්‍යවරුන් යයි කියා ගන්නා පිරිසකට ලෙහෙසියෙන් ගොදුරුවෙති.